# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1981 අංක 23 දරන
# බලන්ගොඩ ශ්‍රී සුදර්ශන විහාර වර්ධන සමිතිය (සංස්ථාගත කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ 1981 මාර්තු මස 30 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

1981 අප්‍රේල් මස 03 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී
කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

මිළ : ශත 45 යි    තැපැල් ගාස්තුව : ශත 50 යි

## 1981 අංක 23 දරන බලන්ගොඩ ශ්‍රී සුදර්ශන විහාර වර්ධන සමිතිය (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1981 මාර්තු මස 30 වන දින]

එල්. ඩී.—ඕ. 32/80.

**බලංගොඩ ශ්‍රී සුදර්ශන විහාර වර්ධන සමිතිය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

"බලන්ගොඩ ශ්‍රී සුදර්ශන විහාර වර්ධන සමිතිය" යනුවෙන් හඳුන්වනු ලබන හා සඳහන් කරනු ලබන සමිතියක්, එහි සාමාජික යන් එකඟ වූ රීති අනුව, එකී සමිතියට සම්බන්ධ සියලු කරුණු ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ සහ කරගෙන යාමේ කාර්යය සඳහා බලන්ගොඩ මෙතෙක් කල් පිහිටුවා තිබූ හෙයින් ද : පූර්විකාව.

එකී සමිතිය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ හා කරුණු සඳහා ද ඒ පරමාර්ථ හා කරුණු එකී සමිතිය විසින් මේ දක්වා සාර්ථක ලෙස ක්‍රියාත්මක කාර සහ කරගෙන ගොස් ඇති හෙයින් සහ සංස්ථාගත කරනු ලැබීමට ඉල්ලුම් කර ඇති හෙයින් ද එකී ඉල්ලීම ඉටු කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1981 අංක 23 දරන බලන්ගොඩ ශ්‍රී සුදර්ශන විහාර වර්ධන සමිතිය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. මේ පනත ආරම්භ වීමේ දින සිට සහ ඉන් පසු (මෙහි මින් මතු "සමිතිය" යනුවෙන් සඳහන් කරනු ලබන) බලන්ගොඩ ශ්‍රී සුදර්ශන විහාර වර්ධන සමිතියේ දැනට සාමාජිකයන්ව සිටින හා සිටින තාක් තැනැත්තන් හෝ මෙයින් සංස්ථාපනය කරනු ලබනු (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) සංස්ථාවට මින් මතු ඇතුලත් කර ගනු ලබන සාමාජිකයන් ද "බලන්ගොඩ ශ්‍රී සුදර්ශන විහාර වර්ධන සමිතිය" යන නාමය හා අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර, පොදු මුද්‍රාවක් තබාගෙන එය පාවිච්චි කිරීමේ ද ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය හා අධිකාරය ඇතිව සංස්ථාව විසින් එකී නාමයෙන් සියලු අධිකරණවල නඩු පැවරීම හා එයට විරුද්ධව නඩු පවරනු ලැබීම කළ යුතු ද කළ හැකි ද විය යුතු ය. බලන්ගොඩ ශ්‍රී සුදර්ශන විහාර වර්ධන සමිතිය සංස්ථාගත කිරීම.

3. සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද ඒ පොදු පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ :— සංස්ථාවේ පොදු පරමාර්ථ.

(අ) පරියත්ති, පටිපත්ති හා පටිවේද යන ත්‍රිවිධ සද්ධර්මය අධ්‍යයනය කිරීම හා ඒ පිළිබඳ පර්යේෂණ පැවැත්වීම සඳහා ධෛර්ය දීම පිණිස බලන්ගොඩ ශ්‍රී සුදර්ශන මහා විහාරය ථෙරවාද බෞද්ධ ආශ්‍රමයක් වශයෙන් පවත්වාගෙන යෑම හා එය නඩත්තු කිරීම,

(ආ) බලන්ගොඩ ශ්‍රී සුදර්ශන මහා විහාරය හා එයට අනුබද්ධ ආයතන වැඩිදියුණු කිරීම දිරිගැන්වීම ; සහ

2—ජ 44859—10,550 (81/04)

(ඇ) සාමාජිකයන්ගේ හා පොදු මහජනයාගේ සමාජයීය හා සංස්කෘතික දියුණුව සඳහා අවශ්‍ය ගොඩනැගිලි හා පරිසර අලංකරණ ලබාදීම හා ඒවා පවත්වාගෙන යාම.

කළමනාකාර මණ්ඩලය.

4. (1) සංස්ථාවේ කටයුතු, සංස්ථාවේ තත් කාලයේ බලපවත්නා රීතිවලට යටත්ව, පහත දක්වෙන තැනැත්තන්ගෙන් සමන්විත කළමනාකාර මණ්ඩලයක් විසින් පරිපාලනය කරනු ලැබිය යුතු ය :—

(අ) බලන්ගොඩ ශ්‍රී සුදර්ශන මහා විහාරාධිපතීන් වහන්සේ නිල බලයෙන් සභාපති වශයෙන් ;

(ආ) සංස්ථාවේ රීතිවලට අනුකූලව තෝරා පත් කර ගත යුතු උපසභාපතිවරුන් දෙදෙනෙක්, ලේකම්, භාණ්ඩාගාරික සහ සංවිධායක ; සහ

(ඇ) සංස්ථාවේ රීතිවලට අනුකූලව තෝරා පත්කර ගත යුතු එම රීතිවල සඳහන් වෙනත් සාමාජිකයන් සංඛ්‍යාවක්.

(2) මේ පනත ක්‍රියාත්මක වන අවස්ථාවේ දී ධුර දරමින් සිටින සමිතියේ කළමනාකාර මණ්ඩලයේ සාමාජිකයන් සංස්ථාවේ ප්‍රථම කළමනාකාර මණ්ඩලය විය යුතු ය.

සංස්ථාවේ රීති.

5. (1) සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම හෝ ඔවුන් නෙරපීම සඳහා ද, කළමනාකාර මණ්ඩලයේ සහ සංස්ථාවේ විවිධ නිලධරයන්ගේ, අනුයෝජිතයන්ගේ සහ සේවක යන්ගේ කාර්ය කරගෙන යාම සඳහා ද, කටයුතු කිරීමෙහි ලා කාර්ය පටිපාටිය සම්බන්ධයෙන් ද, සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සඳහා සහ එහි පරමාර්ථ මුදුන්පත්කර ගැනීම සඳහා අන්‍යාකාරයකින් ද සාමාජිකයන්ගේ යම් මහා සභා රැස්වීමකට පැමිණ ඡන්ද දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකක ඡන්දයෙන් සංස්ථාව විසින් කලින් කල රීති සෑදීම නීත්‍යනුකූල විය යුතු ය.

(2) තත්කාලයෙහි බලපවත්නා සංස්ථාවේ කිසිම රීතියක් හෝ මින් මතු සම්මත කරගනු ලබන යම් රීතියක් හෝ වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම, එය සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම සංස්ථාවේ මහා සභා රැස්වීමකට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකක ඡන්දයෙන් හැර, කරනු නො ලැබිය යුතු ය :

එසේ වුව ද ඒ වෙනස් කිරීම, එකතු කිරීම, සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම කළමනාකාර මණ්ඩලය විසින් අනුමත කරනු ලැබුවහොත් මිස බල නොපැවැත්විය යුතු ය.

(3) මේ පනත ක්‍රියාත්මක වන අවස්ථාවේ දී බලපැවැත් වූ සමිති යේ රීති මේ වගන්තිය යටතේ සාදනු ලැබූ සංස්ථාවේ රීති ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) සංස්ථාවේ සියලුම සාමාජිකයන් තත් කාලයෙහි බලපවත්නා සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

සංස්ථාව විසින් චංචල හෝ නිශ්චල දේපළ දැරිය හැකි බව.

6. යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක් හෝ අන්තිම කැමති පත්‍රයකින් දේපළ බැහැර කිරීමක් ප්‍රකාර හෝ අන්‍යාකාරයකින් හෝ සංස්ථාව වෙත සතු කරනු ලැබිය හැකි චංචල හෝ නිශ්චල හෝ යම් දේපළක් ගැනීමට හා දැරීමට නීතිය අනුව හැකියාව හා ශක්‍යතාව සංස්ථාවට තිබිය යුතු අතර, ඒ සියලු දේපළ විකිණීමේ, උකස් කිරීමේ, බදු දීමේ, හුවමාරු කිරීමේ හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමේ සම්පූර්ණ බලය ඇතිව සංස්ථාවේ තත් කාලයෙහි බලපවත්නා රීතිවලට යටත් ව සංස්ථාව විසින් මේ පනතේ කාර්ය සඳහා ඒ සියලු දේපළ දරනු ලැබිය යුතු ය.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

7. (1) බැංකු ගිණුම් විවෘත කිරීමේ, පවත්වාගෙන යාමේ සහ වැසීමේ ද ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීමේ හෝ ලබා ගැනීමේ ද ප්‍රදානයන් හා පරිත්‍යාගයන් ලබා ගැනීමේ ද සිය අරමුදල් ආයෝජනය කිරීමේ ද සංස්ථාවේ පරමාර්ථ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය සේවක මණ්ඩලය සේවයට ගැනීමේ, සේවයේ නියුක්ත කර ගැනීමේ සහ සේවයෙන් පහකිරීමේ ද බලය ඇතුළුව, සංස්ථාවේ පරමාර්ථ හෝ එම පරමාර්ථ අතුරින් යම් කිසිවක් හෝ වැඩි දියුණු කිරීම හෝ නංවාලීම සඳහා අවශ්‍ය වන හෝ යෝග්‍ය කවර ආකාරයේ වුව ද සියලු ක්‍රියා කිරීමේත් සියලු කරුණු ඉටු කිරීමේ සහ සියලු දේ ක්‍රියාත්මක කිරීමේත් බලය සංස්ථාවට ඇත්තේ ය.

(2) 6 වන වගන්තිය සහ මේ වගන්තියේ (1) වන උපවගන්තිය මගින් සංස්ථාව වෙත පවරන ලද බලතල කළමනාකාර මණ්ඩලය විසින් ක්‍රියාවේ යෙදවිය යුතු ය.

සමිතිය විසින් ගෙවිය යුතු ණය හා සමිතියට අයවිය යුතු ණය.

8. මේ පනතේ කාර්ය සඳහා, මේ පනත ක්‍රියාත්මක වන අවස්ථාවේ දී පැවැති සමිතියේ සියලු ණය හා බැරකම්, මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවිය යුතු අතර, සමිතියට අයවිය යුතු සියලු ණය හා සමිතියට ගෙවිය යුතු සාමාජික මුදල් හා දායක මුදල් සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව තැබිය යුතු ආකාරය.

9. කළමනාකාර මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී හැර, සංස්ථාවේ මුද්‍රාව කවර හෝ සාධන පත්‍රයකට තබනු නොලැබිය යුතු අතර ඒ සාමාජිකයන් දෙදෙනා තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් ඒ සාධන පත්‍රයෙහි තම නම් අත්සන් කළ යුතු ය. තව ද ඒ අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමට බාහිරව විය යුතු ය.

ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

10. මේ පනතෙහි සඳහන් තැනැත්තන්ගේ හා ඔවුන් මගින්, ඔවුන් ගෙන් හා ඔවුන් යටතේ හිමිකම් පාන්නවුන්ගේ අයිතිවාසිකම්වලට හැර, ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තන්ගේ හෝ අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 30 කි. (විදේශීය රු. 40 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.